## උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව : ලිහිල් බසින්

තවද උගනිතොත් නිවැරදි ශිල්පයක් මිස වැරදි ශිල්පයක් උගැන්මෙන් මොලොවට ප්‍රයෝජනයක් මුත් පරලොවට ප්‍රයෝජනයක් නොමැති බැව් දක්වීමට උග්ගසේන නම් සිටුපුත්හුගේ කතාව කියමු. ඒ කෙසේද යත්;

නැටුමෙහි දක්ෂ .න්සියක් දෙනා අවුරුද්දේ මාස හයකට වරක් රජගහා නුවරට පැමිණ රජතුමාට සතියක් පුරා නැටුම් දක්වා බොහෝ රත්රන් ලබා ගනිති. අතරතුර ලබන සංග්‍රහයන් ද බොහෝ ය. බොහෝ දෙනා ද මැසි මත මැසි බැඳ ක්‍රීඩා බලති.

එක් දවසක කඹයක නටන තැනැත්තකුගේ දූවක් උණ දණ්ඩක් මුදුනේ නටන එක් ශිල්පයක ආධාරයෙන් උඩ අහසේ සක්මන් කරයි; නටයි; ගී කියයි. එදින උග්ගසේන නම් සිටුපුත්‍රයා මිතුරකු සමග මැස්සකට නැඟී අහසේ නටන ඒ ශිල්ප දත් දූවගේ හැඩරුව දැක, වාතය අධික බැවින් (එනම් උඩ අහස නටන නිසා ප්‍රකෘති රූපය නොදැක) රූප සම්පත්තියේ නියම සුලකුණු මහත් සේ පෙනෙන බැව් නොසිතා ඇය කෙරෙහි බලවත් වූ ප්‍රේමයෙන් ''ලද හොත් ජීවත් වෙමි, නොලද හොත් මැරෙමි'' යි සිතා ගෙන නොකා නොබී ඇඳට වැදී සිටියේ ය. දෙමාපියෝ ඒ අසා ''පුත, එසේ කිරීම (එනම් නටන දූ විවාහ කර ගැන්ම) තොපට මෙන්ම අපට ද සුදුසු නැත. සුදුසු තැනකින් විවාහයක් කර දෙන්නෙමු'' යයි කීවෝ ය. ඔහු කිසිසේත් ඊට එකඟ නොවීය. කමැති නොවූයෙන් ඔහුගේ මිතුරා ගෙන්වා මසුරන් දහසක් දී ''අර, අහසෙහි කරණම් ගැසූ දක්ෂ ශිල්පිණියගේ පියාට මෙය දී ලා තම දූව මගේ පුතාට සරණකර දෙන්න කියව'' යි පිටත් කර හැරියේ ය.

නැටුම් ශිල්පියා ඒ අසා ''මගේ දූ නොවිකුණමි. රත්රන් වලට වුව ද නොදෙමි. අපි රැකෙන්නේ ඇය නිසා නොවේ ද? නොලද හොත් මැරෙන්නේ නම් මිය යාමෙන් අදහස ඉටුවේ ද? අප හා එක් වුවහොත් පමණක් ඇය පවා දෙමි' යි කියා සිටියේ ය. දෙමාපියෝ ඒ අසා අනුමතිය නොලැබෙන බැව් කීවෝය. ''එසේ නම් මම උන් හා එක්වෙමි'' යි කියා නැදෑ හිතමිතුරන් නොයෙක් අන්දමින් වැළැක්වීමට උත්සාහ ගත්ත ද තමාට කල යුතු කාර්‍ය්‍ය ගැන නොසිතා නැටුම් ශිල්පියා වෙත ගියේ ය. නැටුම් ශිල්පියාණෝ ද සිටු පුත් දන්නා නැටුම් ශිල්පයක් නැතත් ඒ දෙය මේ දෙය අල්වා ගන්නට (එනම් අත් උදව් උදෙසා)



Scanned with CamScanner

උදව්කාරයෙක් අවශ්‍ය බැවින් දුවණිය විවාහ කර දී ඔහුත් සමඟ රටපුරා ක්‍රීඩා, නැටුම් දක්වමින් ඇවිදින්නෝ ය.

ඒ නැටුම් දත් දූ ටික කලකින් සිටු පුත්‍රයාට දා ව පුතකු වදා පුතු නළවන කල ''ගැල් බලාගන්න තැනැත්තාගේ පුත'', බර උසුලන්නවුන්ගේ පුත'', ''කිසිම දෙයක් නොදන්නවුන්ගේ පුත'' යි කියමින් පුතු නළවන්නීය. සිටු පුත්‍රයා ද කරත්ත (ගැල්) නවත්වන තැන් වලදී ගොනුන්ට තණ ගෙනවිත් දමයි. ක්‍රීඩා නැටුම් දක්වමින් යන තැන්වලට අවශ්‍ය දේ අදිති. ඒනිසා නැටුම් ශිල්පිණිය ද පුතු නළවන විට දි එසේ කියයි. සිටු පුත්‍රයාණෝ ද එම ගී අන් අයෙකු නොව තමා එල්ලකොට කියන බැව් දැන ''මේ හැම මා එල්ල කොට කියන්නේ නොවේද'' යි ඇසුවෝය. ''එසේය, වෙන කාහට කියම් ද? තොප ඇවිදමින් කරන කාය්‍ර්යන් නිසා තොපම එල්ල කොට කියමි' යි කීය. ''තොප නිසා විද්වත් වූවා මදිවාට (එනම් නැටුම් ශිල්ප කුලයට බැඳුනාට) අවලාද ත් ඇසිය යුතු ද? ආපසු යමි'' යි අවලා ද නතර කර ගනු පිණිස කීය. ඈය ද'' තොප ගියාට හෝ නැවතුනාට කම් නැත. කිසිවක් නොදන්නා අයෙකුගෙන් මට වැඩක්වේද '' යි කියමින් වැරදි අයුරින් සූදානම් කළ අශ්වයා පටිය අදිත්ම අදිත්ම දුවන්නා සේ එයම කිය කියා පුතු නළවයි. (මෙහි අවකම්පන යනු අශ්වයෙකුගේ ගමන පාලනය කරන කඩියාලම, එනම් නැහැය මතින් දමා ඇති පටිය ප්‍රතිවිරුද්ධ දිසාවට යාමට වැරදි අන්දමින් සකසා තිබීම ය)

ඕ තොමෝ තමාගේ රූප සම්පත්තියෙන් උඩගුව සිටු පුත්‍රයා තමාගේ මෙහෙකරුවෙකු තරම්වත් නොසිතන්නී ය. සිටු පුත්‍රයාණෝ ද මැයගේ මේ අහංකාරය මැට වඩා සම්පත් ඇති අය සිටිනා බැවින් ධනය මුල්කොට ඇති වූවක් නොවේ. තමා උසස් කුලවන්ත නොවන නිසා කුලය මුල්කොට ඇති වූවක් ද නොවේ. රූමත් නිසා හා තමන් ශිල්පය දන්නා නිසා පමණි. මෑ දන්නා ශිල්ප පමණක් උගතොත් මිස සමාන නොවන්නේ නොවේ ද? ඇගේ ඒ පහත් කොට සැලකීම බිඳිනු වස් මම ද ශිල්ප උගන්නෙමි. එසේ සිතා මාමණ්ඩිය වෙත ගොස් තමන්ගේ දක්ෂතාවෙන් ශිල්ප ඉගෙන මුදල් පිණිස රටපුරා ශිල්ප දක්වමින් යන්නේ තමා උපන් නගරය නොවේදැ යි ලැජ්ජාව මැඩ ගනිමින් රජ ගහ නුවරට පැමිණ දින හතකින් ශිල්ප දක්වමි''යි උග්ගසේන සිටු පුත් නරගවාසීන්ට දන්වා සිටියේ ය.



හත්වන දවසේ විශාල පිරිසක් මැසි මත මැසි බැන්දෝය. උග්ගසේන සිටු පුත්‍රයාණෝ ද රියන් හැටක් දිග උණ දණ්ඩක් බිම සිටුවාලා උණදණ්ඩ මුදුනට නැංගෝය. එදින අලුයම බුදුන්වහන්සේ ලොව බලන සේක් උණ දණ්ඩ අගට නැගීමට පෙර තමන් වහන්සේගේ නුවණ නමැති උණ දණ්ඩ අග සිටින්නාවූ අය දැක සිදුවීමට යන්නේ කුමක්දැ'යි බලන්නේ සිටු පුත් තෙමේ ශිල්ප දක්වමි' යි කියා උණ දඬු අග සිටින්නේ ය. ඔහුගේ නැටුම් (කරණම්) දක්නා පිණිස බොහෝ දෙනා රැස් වෙති. මම එතැන දී ගාථාවක් කියමි. ඒ අසා අසූ හාරදහසක් දෙනා නිවන් දකිති. උග්ගසේනයන් ද උණ දණ්ඩ් මුදුනේ දීම රහත් වෙති' යි දැන වදාළ සේක. එසේ දැන දෙවන දවසේ පිඬු සිඟා වඩිනා වේලාව සලකා මහා සංඝයා පිරිවරා රජගහ නුවරට සිඟා වැඩි සේක.

උග්ගසේන නම් සිටුපුත් ද බුදුන් වහන්සේ ඇතුලු නුවරට වැඩම කිරීමට පෙර ක්‍රීඩා නැටුම් බැලීමට රැස්වූවන් ගේ ඔල්වරසන් මැද උණ දණ්ඩ අග ඇඟිලි වලින් සිට හත් වාරයක් පෙත්තක් පරිදි කැරකී කරණම් දක්වා උණ දණ්ඩ මුදුනේ සිටියේ ය. ඒ වේලාවටම බුදුන් වහන්සේ ඇතුල් නගරයට වඩින්නේ රැස් වූ පිරිස සසර අග වූව ද සිටුවීමට සමත් වූ තමන් වහන්සේගේ දිසාව බලනු විනා සැට රියනක් පමණ වූ උණ දණ්ඩ අග මිස ඊට වඩා ඉහළ සිටින්නට හැකියාවක් නැති උග්ගසේනයන් දෙස නොබලා සිටින ලෙසට අධිෂ්ටානයක් කළ සේක.

උග්ගසේනයෝත් තමන් දක්වන කරණම් තමන් පමණක් මිස රැස් වූවන් නොබලන බැව් දැන කලකිරී අවුරුදු හය හමාරකට පසුව දක්වන විස්මිත කරණම් බුදුන් මෙතැනට සපැමිණියෙන් උන් වහන්සේ පළමු වරට දුටුවා සේ ඒ දෙස (බුදුන් දෙස) බලා සිටිනවා මිස මේ නගරයේ මුල් වරට මා දක්වන ක්‍රීඩා බලන්නවුන් නැත. පැසුණු ගොයම බොල් වූවා සේ (මුල් ඇදී පැළ වූවා සේ යන අර්ථය ද දැක්විය හැකිය) ඉතා අසීරුවෙන් උගත් ශිල්පයෙන් ප්‍රතිඵලයක් නැතිවිය ' යයි සිතුහ. බුදුන්වහන්සේත් ඔහුගේ අදහස දැන මහ මුගලන් තෙරුන්වහන්සේ අමතා උග්ගසේන සිටු පුත්‍රයාට ශිල්ප දක්වන්නට කියව'යි වදාළ සේක. මහ මුගලන් තෙරුන් වහන්සේ ගොස්

ඉඩිඝ පස්ස නටපුත්ත - උග්ගසේන මහම්බල
කරෝහී රඩ්ග පරිසාය - හා සයයස්සු මහා ජනං



Scanned with CamScanner

යන ගාථාව වදාරා බුදුන් කී කටයුත්ත දැන් වූ සේක. ක්‍රීඩා කරණම් හි යෙදීමට බුදුන් මහ තෙරුන්වහන්සේ ලවා අණ කළේ මන්ද යත්; පසුව ඔහුට අත්වන ප්‍රයෝජන සලකා ගෙන ය. උග්ගසේනයෝ ද මහ තෙරුන්වහන්සේ ගේ වචන අසා බුදුහුත් මාගේ ශිල්ප දැකීමට කැමති නිසා විය යුතුය'' උණ දණ්ඩ අග සිටම

ඉඩිඝ පස්ස මහා පඤ්ඤ - මොග්ගල්ලාන මහිද්ධික
කරෝමි රඞ්ගං පරිසාය - හාසගම් මහාජනං

කියමින් දණ්ඩ අගින් අහසයට නැඟ දාහතර වාරයක් පමණ අහස සිසාරා (එනම් කරණම් ගසා) බැස උණ දණ්ඩ අග සිටියාහු ය.

බුදුන් ද දහම් දෙසන සේක් ''උග්ගසේනයනි, ක්‍රීඩා නැටුම් හි ආලය අත හැර පෙර දවස පැවති පංචස්කන්ධයේ ආශාව ද ඉවත ලව. එම පංචස්කන්ධයට මතු දවස (ඊළඟ ආත්මය) ඇති ඇල්මක් ඉවත ලව. දැන් පවත්නා පංචස්කන්ධ ආසාව ද දුරු කරව. එසේ කළ විට කෙළි නළු පමණක් නොව ජාති ජරා මරණයෙන් ද මිදේ'' යි වදාළ සේක. දේශනාව අවසානයේ දී අසූ හාරදහසක් පමණ මිනිස්සු නිවන් දුටුවෝ ය.

උග්ගසේන සිටු පුත්‍රයෝ ද කරණම් ගසා රහත් වීමට නොහැකි නමුත් උණ දණ්ඩ අග දී පිළිසිඹියා (විමසුම ඇසින් බලා දැන ගැනීමේ නුවණ ) පත්ව රහත්ව උණ දණ්ඩෙන් බැස, බුදුන් සමීපයට ගොස් පසඟ සිටුවා වැඳ මහණ කරවන්න'යි අයැද සිටියෝ ය. බුදුන් ද දකුණත දික්කොට මහණ මෙහි එවයි'' වදාළ සේක. (ඒහි භික්ෂු භාවයෙන් මහණ කිරීම) ඒ අවස්ථාවේදී ම තුන් සිවුරු (එනම් අඳන කඩය, තනිපට සිවුර, දෙපට සිවුර) ආදී වූ අටපිරිකර සහිතව හැට අවුරුදු පිරුණු මහතෙර කෙනෙකු වහන්සේ නමක් මෙන් සිතුවිලි සහිත වූ සේක. භික්ෂූන් වහන්සේලා ද ''ඇවැත්නි, හැට රියන් උස උණ දණ්ඩේ දී භයක් නොවිද'' යි අසා 'අපට භයක් නොවීය' කී කල්හි බුදුන්වෙත ගොස් ''ස්වාමීනි. උග්ගසේන තෙරුන් උණ දණ්ඩෙන් බසින විට තමන්ට භයක් නොදැනුනේය යයි කියති. එලෙස කියා තමන් රහත් වූ බවක් හඟවති'' යි කී සේක. බුදුහුත් '' මහණෙනි මගේ පුතුන් වැන්නවුන්ට (එනම් භික්ෂූන්ට) භයක් කොයින් ද?'' යි වදාරා බ්‍රහ්මණ වග්ගයෙන් (ඒ නම් වූ ගාථා සහිත කොටසින්) ගාථාවක් වදාළ සේක. අවසානයේ දී බොහෝ දෙනා නිවන් දුටුවෝ ය.



එබැවින් නුවණ ඇත්තවුන් විසින් ප්‍රයෝජන රහිත කෙළි, නැටුම් ආදියේ ආලය හැර, නිවනෙහිම ඇල්ම ඇතිව, තුන් දුසිරිතෙන් ඈත්ව තෙආකාර වූ හොඳ සිරිත් පුරමින් මතු මත්තෙහි ලෞකික ලෝකෝත්තර ගුණ විශේෂයන් හි පිහිටිය යුතුය.

නැවත එක් දිනයක ධර්ම සභාවේ 'ඇවැත්නි, රහත් වන්නට නිසි පින් සහිත කෙනෙක් නැටුම් ශිල්පීන් හා එක්වීමට හේතුව කවරේ ද? රහත්වීමට කළ පින්කම කවරේද' යි කතාවක් මතුවිය. බුදුහු ඒ අසා ''මේ දෙකට ම සුදුසු දේ කළෝ මේ තෙමේම ය'' යි වදාරා එය පැහැදිලි කිරීමට පෙර දවස කසුප් බුදුන්ගේ රන් දාගැබ කරද්දී බරණැස නුවර මිනිස්සු බත් සහල් ගෙන දාගැබ බැඳීමේ කටයුත්තට යන්නාහු අතර මඟ එක් තෙර කෙනෙකුන් වහන්සේ සිඟා වඩිනු පක් කුල කාන්තාවක් දැක, ස්වාමියාට ''එක් තෙර කෙනෙකුන් වහන්සේ පිඬු සිඟා වැඩි සේක. ගෙන යන බත් ගැල් වල බොහෝ ය. බත් පාත්‍රයක් පිළිගැන්වීමට පාත්‍රය ඉල්වා ගන්නැ'යි කීවා ය. ඔහුත් වහා පාත්‍රය ඉල්ලාගෙන ආවේය. බත් පාත්‍රය පුරවා භික්ෂුවට පිළිගන්වා නිවන් දකිම්වා යයි පතා ගත්තේය. ඔහු පිළිගැන්වූ දානයට හමුවූයේ ද රහත් වහන්සේ නමකි. ඒ නිසා දිවැසින් බලත්ම පැතුම එසේම සිද්ධ වන බැව් දැන සිනා පහළ කළ සේක; (රහතුන් වහන්සේ) දන් දුන් උපාසිකාවෝද සිනා පහළ කල බැව් දැක කරුණු නොදැන ස්වාමියාට උන් වහන්සේ සිනා සුන සේක. විද්දත් කමක් ඇති නිසා විය යුතුය' යි කීවාය. ස්වාමියා ද එසේ නොකියවයි නොකියාම ඒ අයගේ සැටිය'යි කියා ඈ කී දේම පිළිගෙන නික්මුණේය. මේ ඔවුන් දෙදෙනා කළ කී දේය. ඔවුන් එහි ආයුෂ ගෙවා දෙව් ලොව ඉපිද ඉන් චුතව ඒ එලෙස බස් කී ස්ත්‍රිය විද්දත් දූව උපන්නා ය. උග්ගසේනයෝ සිටු කුලයේ ඉපැදුන ද විද්දත් බිරිය කී බස පිළිගත් නිසා තමා විද්දත් නොවූව ද (එනම් නැටුම් ශිල්පීන්) විද්දතුන් හා එක්විය. රහතුන් වහන්සේට පූජාකල බත් පාත්‍රයෝ අනුහසින් උග්ගසේන තෙරහු රහත් වූහ. විද්දත් දූ මෙහෙණි සස්නේ මහණ වී රහත් වීමෙන් මිනිස් ආත්මයේ හීන කුලයේ උපන්න ද ආර්ය කුලයට එකතු වී ජාතියෙන් සමාන වීය''යි වදාළ සේක.

මේ සිත්හි තබා, අනුන් පහත් කොට පරිහාස කිරීමෙන් වැළකිය යුතුය.



Scanned with CamScanner

CS CamScanner

## අමාරු වචන තේරුම් හා විස්තර

1. ඓහලෞකික - මෙලොවට අයත් / ලෞකික
2. පාරලෞකික - පරලොවට අයත් / ලෝකෝත්තර
3. නටන විද්දනු - නටන විද්‍යාව උගත් / විද්‍යාව දත් අර්ථයේ ද යෙදේ
4. හුණ දඬු - උණ දණ්ඩ
5. යාළුණු - මිත්‍රයා
6. හාවලීලා - ස්ත්‍රී සුලකුණු (සිත් ගන්නා අඟ පසඟ)
7. වයොත්වාධික - වායුව අධික කොට ඇති (වාතය පිරුණු)
8. විකාරයක් - ශරීරය පිළිබඳ වෙනස් ආකාර වූ ලක්ෂණ / එනම් ලුහු බව, මෑදු බව වැනි
9. නියාව - බැව්
10. නොගිවිසීමත් ය - එකඟ නොවා
11. ඌම නොවේ ද? - ඔහුම නොවේ ද?
12. කෙළි ලළු - කෙළි නළු
13. තමන් අරබයා - තමා පිණිස
14. නපුරුත් (ඇසුව මනාද?) - අවලා ද / අපහාස
15. අවකප්පනයෙන් - පහතට ඇදීම
16. සයංසිද්ධ - සමානවීම
17. බැවුම් පලවා - පහත් කොට සැලකීම නවත්වා
18. මයිලණුවන් - මාමණ්ඩිය
19. පයි ඇදිමෙන් - පසුම්බි ඇදීමෙන් ('මුදල් දී' යන අර්ථය ද ගනී)
20. උපන් වැඩී නුවර - ඉපදී වැඩුණු නගරය
21. සුවාසූ දහසක් - අසූහාර දහසක්
22. මහණ ගණ - සංඝ සමූහයා
23. කොක්සන් ගසන නියාව - මහත් හඬින් සිනා සීම
24. සිසැරී ලා - සිසාරා ගොස්
25. ඉටා වදාළ සේක - අධිෂ්ඨාන කළ සේක



26. අරුමයක් - පුදුමයක්
27. මෙහෙවර - රාජකාරිය
28. ඕ හට - ඔහුට / ඇයට
29. තුදුස් විටක් - දාහතර වාරයක්
30. පස්කදෙහි - පංචස්කන්ධය
31. (පිළිසිඹියා පත් රහත්ව) - පටිසම්භිදාවන්ට පත් (විශ්ලේෂණය කොට දැන ගන්නා නුවණ
32. පසඟ සිටුවා වැඳ - පස් අංගය බිම ස්පර්ශ වන සේ වැඳීම / එනම් හිස, නළලත, දෙදණ හා වැළමිටි 2ක
33. තුන් සිවුරු - අඳන කඩය, තනි පට සිවුර, දෙපට සිවුර
34. අට පිරිකර - භික්ෂුවකගේ ප්‍රයෝජනයට දෙනු ලබන පිරිකර අට එනම් අඳනය, තනි පට සිවුර, දෙපට සිවුර පටිය පාත්‍රය, කඩ කැත්ත, ඉඳි කටුව, පෙරහන්කඩය.
35. ඇලුම් - කැමති
36. තුන් දුසිරිත - වාග්, කාය, මනෝ දුසිරිත
37. ලෙවී ලොවිතුරා - ලෞකික - ලෝකෝත්තර
38. ධම් සබෙයි - ධර්ම සභාව
39. තුමූ ම ය - මොහුම ය.
40. විහුත (කරන්නට) - පැහැදිලි කිරීමට
41. සමණන්ට - හිමියාට / ස්වාමියාට
42. චුත වී - ඉකුත්ව
43. ආර්ය ජාතීන් - මාර්ග ඵලයන්ට පැමිණි උතුමෝ
44. පිරිහෙළා (කීම) - පහත් කොට / නිග්‍රහ කොට කීම



Scanned with CamScanner